Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වගකීම් ඉටු කිරීමේ දී දේශපාලන බලතල බෙදා හැරීමේ බලපෑම

*අයි. එච්. අයි. එම්. බණ්ඩාර* [1]
*එම්. කේ. නදීකා දමයන්ති* [2]

**සංක්ෂේපය**

විමධ්‍යගතකරණය ලෝකයේ සෑම ප්‍රජාතන්ත්‍රවාදී රටක්ම වර්තමානයේ පිළිගත් සංකල්පයකි. ශ්‍රී ලංකාවේ ද විමධ්‍යගතකරණ මාදිලියක් වන දේශපාලන බලතල බෙදා හැරීම යටතේ 1987 දී පළාත් සභා පිහිටුවන ලදී. ඒ අනුව එතෙක් මධ්‍යම ආණ්ඩුව යටතේ පැවති බලතලවලින් කිසියම් ප්‍රමාණයක් පළාත් සභා සඳහා ලබා දෙන ලදී. ගොවිජනසේවා විෂයය ද එසේ පැවරූ විෂයකි. කෘෂිකාර්මික හා ගොවිජනසේවා ක්ෂේත්‍රයේ පළාත් මෙන් ම මධ්‍යයේ වගකීම් ද බිම් මට්ටමේ දී ඉටු කිරීමට පැවරී ඇති නිලධාරියා වන්නේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරයා. නමුත් ඔවුන්ගේ වගකීම බැඳී ඇත්තේ මධ්‍යම ආණ්ඩුව සමගිනි. ඒ අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ට මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභා සම්බන්ධයෙන් පැවරී ඇති රාජකාරි නිසියාකාරව ඉටු කරන්නේ ද යන්න විමසීම මෙම අධ්‍යයනයේ අධ්‍යයන අරමුණ වේ. මේ සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණයක් තුළින් ප්‍රාථමික දත්තත්, ලිපි, ග්‍රන්ථ ආදිය මගින් ද්විතීක දත්තත් ලබා ගන්නා ලදී. අධ්‍යයන ප්‍රදේශ ලෙස කෑගල්ල දිස්ත්‍රික්කය අහඹු ලෙස ගන්නා ලදී. එහි දී දිස්ත්‍රික්කය තුළ විසිරී යන පරිදි කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් 100 ද, ගොවීන් 100 ද අහඹු ලෙස තෝරා ගන්නා ලදී. ක්ෂේත්‍ර සමීක්ෂණයට අනුව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගෙන් 34.3% කෘෂිකර්ම උපදේශක සමග සතියට දින තුනක් නිරත විය යුතු රාජකාරි ඉටු නොකරන අතර 48.5%ක ප්‍රතිශතයක් අවශ්‍ය වුවහොත් පමණක් රාජකාරි ඉටු කරනු ලබයි. මේ අනුව පළාත් සභාවලට පැවරී ඇති කෘෂි උපදේශන සේවා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගෙන් ඉටු නොවේ. නිළධාරීන්ගෙන් 86.9% ක්ම පළාත් සභා සම්බන්ධ අනෙකුත් රාජකාරි ඉටු කරයි. නියදියට ඇතුළත් වූ ගොවීන්ගෙන් 77% අදහස වූයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ගෙන් කෘෂිකාර්මික අංශයට යම්කිසි සේවයක් ඉටුවන බවයි.

මුඛ්‍ය පදඃ- කෘෂිකර්මය, විමධ්‍යගතකරණය, ගොවිජනසේවා, පළාත් සභා, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර

---

2 *ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* universitykelani@gmail.com

3 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථික විද්‍යා අධ්‍යන අංශය , *කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;*